# ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
## මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය

# ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය 2009/10
## අවසාන ප්‍රතිඵල විවරණිකාව

2011

## හැඳින්වීම



ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින්, ජාතික ගෘහ ඒකක සමීක්ෂණ වැඩ සටහන යටතේ පවත්වනු ලබන ප්‍රධාන සමීක්ෂණයක් ලෙස ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය හැඳින්විය හැක. මෙම සමීක්ෂණය 1990 වසර දක්වා ශ්‍රමබල හා සමාජ ආර්ථික සමීක්ෂණය නමින් ශ්‍රී ලංකා ශ්‍රමබල සමීක්ෂණය හා ඒකාබද්ධව පවත්වනු ලැබීය.

1990 සිට ශ්‍රමබල සමීක්ෂණයෙන් වෙන්ව, වෙනම සමීක්ෂණයක් ලෙස ආරම්භවූ ආදායම් වියදම් සමීක්ෂණය 2006/07 වසර දක්වාම වසර 5 කට වරක් පවත්වනු ලැබිය. වේගයෙන් වෙනස්වන ආර්ථික තත්වයන් හමුවේ ශ්‍රී ලාංකීය ජනතාවගේ ආදායම් හා වියදම් රටාවන් නිරීක්ෂණය කිරීමේ වැදගත්කම පිළිබඳ වූ ඉල්ලුම හා අවශ්‍යතාව සපුරාලමින් 2009/10 සිට වසර 3 කට වරක් ආදායම් හා වියදම් සමීක්ෂණය පැවැත්වීමට දෙපාර්තමේන්තුව විසින් තීරණය කරන ලදී.

ජනතාවගේ ආදායම්, වියදම් හා පරිභෝජන රටාවේ කාලීන වෙනස්වීම් ඇති බැවින්, එය පැහැදිලිව නිරීක්ෂණය කරනු වස්, මෙම සමීක්ෂණය අඛණ්ඩව අනුගාමී මාස 12 ක් තුල සිදු කරනු ලබයි. දිස්ත්‍රික් මට්ටමින් ඉතා විශ්වාසනීය දත්ත ලබා ගැනීමට ප්‍රමාණවත් වන පරිදි, නිවාස ඒකක 25,000 ක නියැදියක් සමීක්ෂණය සඳහා තෝරා ගැනේ. 2009/10 වර්ෂවලදී පැවැත්වූ ගෘහ ඒකක ආදායම් වියදම් සමීක්ෂණය, මෙම සමීක්ෂණ මාලාවේ 7 වැනි සමීක්ෂණයයි. දත්ත රැස් කිරීමේ ක්ෂේත්‍ර කටයුතු 2009 ජූලි මාසයේ සිට 2010 ජුනි මාසය දක්වා සිදු කරනු ලැබීය.

දත්ත එකතු කිරීම සඳහා භාවිතා කළ සමීක්ෂණ උපලේඛනය 2006/07 වර්ෂවලදී විශාල වැඩි දියුණු කිරීමක් සිදුකල අතර, සංශෝධිත ආදායම් හා වියදම් සමීක්ෂණයෙහි උපලේඛනය කොටස් 9 කින් සමන්විත වෙයි.

පහත සඳහන් තොරතුරු ආවරණය වන පරිදි ගෘහ ඒකකයේ තොරතුරු එකතු කිරීම මෙම සමීක්ෂණයෙන් සිදු කරනු ලබයි.

1. ප්‍රජා විද්‍යාත්මක තොරතුරු
2. පාසල් අධ්‍යාපනය
3. සෞඛ්‍ය
4. ආහාර සහ ආහාර නොවන ද්‍රව්‍ය සඳහා වියදම
5. ආදායම
6. ගෘහ ඒකකය සතු කල්පවතින භාණ්ඩ
7. මූලික පහසුකම් ලබාගත හැකි ස්ථාන හා ණයගැති භාවය
8. නිවාස පිළිබඳ තොරතුරු
9. ඉඩම් අයිතිය සහ සත්ව පාලනය

### සමීක්ෂණයේ ප්‍රධාන අරමුණු

1. ගෘහ ඒකක ජනගහනයේ ජීවන තත්වයන්, එහි විවිධවූ මට්ටම් සහ වෙනස්වීම්, කාලය සහ ප්‍රදේශයන් අනුව නිරීක්ෂණය.
2. ආහාර ඇතුළු භාණ්ඩ හා සේවාවන්හි පරිභෝජන රාටාව නිරීක්ෂණය කිරීම.
3. මිල දර්ශකාංක, දරිද්‍රතාවය වැනි මානව සංවර්ධන සහ සමාජ ආර්ථික දර්ශක ආගණනය කිරීම.

### සමීක්ෂණය මගින් ආවරණීත ප්‍රදේශ

මන්නාරම, මුලතිව්, කිළිනොච්චි දිස්ත්‍රික්ක හැර දිවයිනේ අන් සියළු දිස්ත්‍රික්ක අතරින් තෝරාගත් නිවාස ඒකක 25,000 ක නියැදියකින් 2009 ජූලි මාසයේ සිට 2010 ජුනි මාසය දක්වා තොරතුරු එකතු කරන ලදී. එම දත්ත ඇසුරින් මෙම ප්‍රකාශනය සකස්වී ඇත.

### විශේෂ කරුණු

- සාමාන්‍ය මාසික ගෘහ ඒකක ආදායම
  - රු. 36,451
- සාමාන්‍ය මාසික ඒක පුද්ගල ආදායම
  - රු. 9,104
- ආදායම් ලබන්නන්ගේ සාමාන්‍ය මාසික ආදායම
  - රු. 20,427
- සාමාන්‍ය මාසික ගෘහ ඒකක වියදම
  - රු. 31,331
- ගෘහ ඒකකයක ප්‍රමාණය
  - පුද්ගලයින් 4.0
- ගෘහ ඒකකයක් තුල සිටින ආදායම් ලබන්නනන් සංඛ්‍යාව
  - පුද්ගලයින් 1.8



### ඇතුල් පිටු


| | |
|---|---|
| හැඳින්වීම | 1 |
| ගෘහ ඒකක ආදායම | 2 |
| ආදායම් මාර්ග | 3 |
| ආදායම් ලබන්නන්ගේ ආදායම | 4 |
| ඒක පුද්ගල ආදායම | 4 |
| ආදායම් විෂමතා | 5 |
| ගෘහ ඒකක වියදම | 6 |
| ගෘහ ඒකකයක ආහාර සඳහා වියදම | 7 |
| ආහාර නොවන ද්‍රව්‍ය සඳහා වියදම | 8 |

# ගෘහ ඒකක ආදායම

මුදල්මය හෝ මුදල්මය නොවන ආකාරයෙන් ගෘහ ඒකකයේ සියළුම සාමාජිකයන්ට ලැබුණු සම්පූර්ණ ආදායම ගෘහ ඒකකයේ ආදායම ලෙස සලකනු ලබයි.

ඒ අනුව, වැටුප් හෝ වේතන වලින් ලැබුණ ආදායම පමණක් නොව, කෘෂිකාර්මික හෝ කෘෂිකාර්මික නොවන කටයුතු කිරීමෙන් ලද ආදායම්, විශ්‍රාම වැටුප්, ආබාධිත හෝ වෙනත් සහන දීමනා, දේපල, කුලී වලින් හෝ ලාභාංශ, පොලී මගින් ලද ආදායම් වන්දි ලැබීම් හෝ ලොතරැයි දිනුම් හිමිවීම වැනි අහඹු ලැබීම් ඇතුළු සියළු ලැබීම්. ආදායම් ලෙස එකතු කරන ලදි.

2009/10 සමීක්ෂණ ප්‍රතිඵල අනුව ශ්‍රී ලංකාවේ සාමාන්‍ය මාසික ගෘහ ඒකක ආදායම රු. 36,451 ක් ලෙස ඇස්තමේන්තු විය. 2006/07 සමීක්ෂණයේදී මෙම ආදායම ලෙස වාර්තා වූයේ රු. 26,286 කි. ඒ අනුව වසර තුනක කාල පරාසයක් තුල ගෘහ ඒකක සාමාන්‍ය මාසික ගෘහ ඒකක ආදායම පවතින මිල ගණන් අනුව සැලකිමේදී 38.7% කින් ඉහළ ගොස් තිබෙනු නිරීක්ෂණය කළහැකි විය. කෙසේ වෙතත්, එම කාලය තුල මූර්ත මාසික ආදායම (මිලෙහි උද්ධමනය නොසලකා සකසන ලද) 1.9% ක පසුබෑමක් පෙන්නුම් කර තිබුණි. කොළඹ පාරිභෝගිකයින්ගේ මිල දර්ශකය (CCPI) 2006/07 සිට 2009/10 වන විට 41.4% ක වර්ධනයක් ගෙන තිබුණි.

සාමාන්‍ය මාසික ආදායමට වඩා මධ්‍යස්ථ මාසික ආදායම වඩා හරවත් දර්ශකයක් වෙයි. 2006/07 සමීක්ෂණයේදී රු.16,735 ක් ලෙසින් වාර්තාවූ මධ්‍යස්ථ ගෘහ ඒකක ආදායම, 2009/10 වන විට, 23,746 ක් දක්වා 42% ක් වර්ධනයවී තිබෙනු නිරීක්ෂණය කළ හැක. එමෙන්ම, මූර්ත මධ්‍යස්ථ ගෘහ ඒකක ආදායමද, 2006/07 සිට 2009/10 වන විට 1% කින් වර්ධනයවී තිබුණි.

රූපය 1 මගින් දැක්වෙන පරිදි, ක්‍රමයෙන් වර්ධනය වන මධ්‍යස්ථ ගෘහ ඒකක ආදායම සමගින් මූර්ත මධ්‍යන්‍ය ආදායමෙහි පසු බැස්ම ජාතික මට්ටමේ ආදායම් විෂමතාවන්හි අඩුවීම පිළිබඳ පැහැදිලි සංඥාවක් සපයනු ඇත.

**රූපය 1 : සමීක්ෂණ කාල අනුව සාමාන්‍ය මාසික, මූර්ත හා නාමික මධ්‍යන්‍ය හා මධ්‍යස්ථ ගෘහ ඒකක ආදායම**




**වගුව 1 : අංශය, පළාත හා දිස්ත්‍රික්කය අනුව ගෘහ ඒකක මධ්‍යන්‍ය සහ මධ්‍යස්ථ ආදායම**

| අංශය / පළාත / දිස්ත්‍රික්කය | මධ්‍යන්‍ය (රු.) | | මධ්‍යස්ථ (රු.) | |
|---|---|---|---|---|
| | 2009/10 | 2006/07 | 2009/10 | 2006/07 |
| | | | | |
| **ශ්‍රී ලංකාව** | **36451** | **26286** | **23746** | **16735** |
| | | | | |
| නාගරික | 47783 | 41928 | 31000 | 23642 |
| ග්‍රාමීය | 35228 | 24039 | 23126 | 16379 |
| වතු | 24162 | 19292 | 17366 | 10480 |
| | | | | |
| **බස්නාහිර** | **47118** | **34282** | **30600** | **21686** |
| කොළඹ | 51070 | 42825 | 34186 | 24711 |
| ගම්පහ | 48870 | 29038 | 29821 | 20564 |
| කළුතර | 35780 | 27721 | 27511 | 18500 |
| **මධ්‍යම** | **31895** | **23875** | **21410** | **14187** |
| මහනුවර | 33063 | 24444 | 22450 | 16203 |
| මාතලේ | 30013 | 19678 | 18606 | 14119 |
| නුවරඑළිය | 31029 | 25621 | 21431 | 11914 |
| **දකුණ** | **32514** | **24059** | **23253** | **16837** |
| ගාල්ල | 31376 | 24907 | 21886 | 17517 |
| මාතර | 30980 | 22914 | 23048 | 16229 |
| හම්බන්තොට | 36879 | 24076 | 26406 | 16784 |
| **උතුර** | **23712** | - | **16710** | - |
| යාපනය | 18917 | - | 14815 | - |
| වව්නියාව | 39640 | - | 29370 | - |
| **නැගෙනහිර** | **23922** | **20811** | **18030** | **14828** |
| මඩකලපුව | 22844 | 21032 | 16129 | 15593 |
| අම්පාර | 24721 | 20676 | 19082 | 14556 |
| ත්‍රිකුණාමලය | 24291 | - | 19154 | - |
| **වයඹ** | **35586** | **22565** | **20961** | **14824** |
| කුරුණෑගල | 36922 | 22870 | 20778 | 14500 |
| පුත්තලම | 32918 | 21939 | 21593 | 15612 |
| **උතුරු මැද** | **35577** | **24759** | **24993** | **16064** |
| අනුරාධපුර | 37586 | 21995 | 25682 | 16133 |
| පොළොන්නරුව | 31526 | 30530 | 22634 | 15913 |
| **ඌව** | **28717** | **21371** | **19761** | **14152** |
| බදුල්ල | 32313 | 22035 | 20982 | 14804 |
| මොනරාගල | 22161 | 20118 | 17226 | 12320 |
| **සබරගමුව** | **36173** | **20712** | **21676** | **13943** |
| රත්නපුර | 41312 | 22741 | 22154 | 14356 |
| කෑගල්ල | 29342 | 18062 | 21122 | 13114 |
| | | | | |

2006/07 සිට 2009/10 දක්වා අතර කාලය තුල නාගරික අංශයේ සාමාන්‍ය මාසික ගෘහ ඒකක ආදායම වර්ධනයවී තිබුණේ 14% කිනි. (රු.41,928 සිට 47,783 දක්වා) මධ්‍යස්ථ මාසික ගෘහ ඒකක ආදායම 23,642 සිට 31,000 දක්වා 31% කින් වර්ධනයවී තිබුණි. අඩු ආදායම්ලාභී නාගරික ගෘහ ඒකක ආදායම් මට්ටම්හි කිසියම් සතුටුදායක තත්වයක් ඇතිවී තිබිණි.

2009/10 දී සාමාන්‍ය මාසික ගෘහ ඒකක ආදායමෙහි හොඳම ප්‍රගතියක් වාර්තා වූයේ වතු අංශය තුලිනි. 2006/07 සිට 2009/10 වන විට රු.19,292 සිට 24,162 දක්වා 25% න්, වතු අංශයේ සාමාන්‍ය මාසික ගෘහ ඒකක ආදායම වර්ධනයවී තිබුණි. එමෙන්ම වතු අංශයේ මධ්‍යස්ථ ගෘහ ඒකක ආදායමද 10,480 සිට 17,366 දක්වා 66% න් වර්ධනයවී තිබුණි.

ග්‍රාමීය අංශය තුලද සාමාන්‍ය මාසික ගෘහ ඒකක ආදායම 46.5% න් වර්ධනය වී තිබු අතර, මධ්‍යස්ථ ගෘහ ඒකක ආදායමද 41% න් වර්ධනයවී තිබුණි.

දිස්ත්‍රික්ක මට්ටමින් සාමාන්‍ය මාසික ගෘහ ඒකක ආදායම විමසීමේදී, වැඩිම සාමාන්‍ය මාසික ගෘහ ඒකක ආදායම කොළඹ දිස්ත්‍රික්කයෙන් වාර්තා විය. අඩුම සාමාන්‍ය මාසික ගෘහ ඒකක ආදායම වාර්තා වූයේ යාපනය දිස්ත්‍රික්කයෙනි.

එමෙන්ම 2006/07 සිට 2009/10 වන විට සාමාන්‍ය මාසික ගෘහ ඒකක ආදායමේ වර්ධනයත්, මධ්‍යස්ථ ගෘහ ඒකක ආදායමේ වර්ධනයත්, ඉහළම අගයකින් වාර්තා වූයේ වතු අංශයේ වැඩිම නියෝජනයක් සහිත දිස්ත්‍රික්ක දෙකක් වන රත්නපුරය සහ නුවරඑළිය දිස්ත්‍රික්ක වලිනි.

## ආදායම් ලබන මාර්ග

ගෘහ ඒකක වෙත අදායම් ලැබීම ප්‍රධාන ආකාර 2 කින් සිදුවනු ඇත. ඒ මුදල්මය වශයෙන් හෝ මුදල්මය නොවන ලැබීම් වශයෙනි. ආර්ථික ක්‍රියාවලියකින් ලැබෙන වැටුප් සහ වේතන, කෘෂිකාර්මික ක්‍රියාකාරකම් (කාලින හෝ කාලින නොවන භෝග වගාවන්) සහ කෘෂිකාර්මික නොවන ක්‍රියාකාරකම් වලින් ලැබෙන ආදායම් මෙන්ම, ආර්ථික ක්‍රියාවලියකින් තොරව ලැබෙන, විශ්‍රාම වැටුප්, ආබාධිත හෝ සමෘද්ධි දීමනා, රට තුල හෝ පිටරටින් ලැබෙන ප්‍රදානයන්, ලොතරැයි දිනුම් වැනි අනියම් හෝ හදිසි ආදායම්, වන්දි මුදල් ප්‍රදානයන් වැනි දේ මුදල්මය වශයෙන් ලබන ආදායම් යටතට ගැනේ.

සමීක්ෂණ යොමු කාලය තුලදී මිලදී ගත් හෝ පරිහරණය කරන ලද භාණ්ඩ හා සේවාවන්හි ඇස්තමේන්තුගත මුදල්මය වටිනාකම, මුදල්මය නොවන ආදායම් කොටසට ගැනේ.

තම ගෙවත්තෙන් පරිභෝජනය කරන ලද එළවළු, පලතුරු හෝ දර ආදියේ වටිනාකම, නියුතුව සිටි ආර්ථික ක්‍රියාකාරකම් වලින් මෙම ගෘහ ඒකකය විසින් පරිභෝජනය කරන ලද ප්‍රමාණය හෝ ලබාගත් සේවාවේ ප්‍රමාණය, සේවා යෝජකයින් හෝ බාහිර පුද්ගලයින් ගෙන් ලැබුණු භාණ්ඩ හෝ භාණ්ඩ සඳහා ලැබුණු මුදල්මය සහන-යන් (දුරකථන, වාහන, නිවාස කුලී) නිවාස හිමියකු නම් තමා වාසය කරන නිවසේ ඇස්තමේන්තුගත මාසික කුලිය යනාදිය මුදල්මය වශයෙන් නොවන ආදායම් ලෙස ගැණේ.

රූපය 2 : 2006/07 සිට 2009/10 දක්වා සාමාන්‍ය මාසික ගෘහ ඒකක ආදායමේ සහ මධ්‍යස්ථ මාසික ගෘහ ඒකක ආදායමේ ප්‍රතිශත වර්ධනය




* *සටහන : 2006/07 සමීක්ෂණයේදී උතුරු පළාත සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය ආවරණය නොවිය,*

ආදායම පිළිබඳව කරුණු පැහැදිලි කිරීමේදී විවිධ වූ ආදායම් මට්ටම් සහිත සෑම ගෘහ ඒකකයක් පිළිබඳවම අවධානය යොමු කිරීම අවශ්‍යයෙන්ම කළ යුත්තකි.

මධ්‍යනය අගය අන්තයේ පිහිටි අගයන්ගේද බලපෑමට යටත් වන බැවින්, ආදායම විස්තර කිරීමේදී මධ්‍යස්ථ අගය සැලකීමෙන් ආදායමේ සමස්ත වැඩිවීමේ පැහැදිලි අවබෝධයක් ලබාගත හැකිය.

දිස්ත්‍රික්කයක මධ්‍යනය ආදායමට වඩා මධ්‍යස්ථ ආදායමේ වැඩිවීමේ ප්‍රතිශතය ඉහළ යෑමෙන් පිළිබිඹු වන්නේ එම දිස්ත්‍රික්කය තුල අඩු ආදායම්ලාභී ගෘහ ඒකකයන්හි ආදායම් තත්වයන්හි වර්ධනයක් සිදුවී පැහැදිලි ලෙස හොඳ ජීවන තත්වයන් ඇතිව තිබෙන බවයි.

වගුව 2 : ප්‍රධාන ආදායම් ලබන මාර්ග අනුව, සාමාන්‍ය මාසික ගෘහ ඒකක ආදායම (2006/07 සිට 2009/10 දක්වා)

| ආදායම් ලබන මාර්ග | 2009/10 සාමාන්‍ය මාසික ආදායම | 2006/07 සාමාන්‍ය මාසික ආදායම |
|---|---|---|
| **සම්පූර්ණ ආදායම** | **36451** | **26287** |
| **මුදල්මය ආදායම්** | **31209** | **22586** |
| වැටුප් හා වේතන | 12434 | 9418 |
| කෘෂිකාර්මික ආර්ථික කටයුතු | 5238 | 3141 |
| කෘෂිකාර්මික නොවන ආර්ථික කටයුතු | 6477 | 4507 |
| වෙනත් මුදල්මය ලැබීම් | 4252 | 3128 |
| අනියම් හෝ හදිසි මුදල්මය ලැබීම් | 2808 | 2392 |
| **මුදල්මය නොවන ආදායම්** | **5242** | **3701** |
| විවිධ ආදායම් | 2054 | 1231 |
| නිවාස හිමි පදිංචි නිවසේ ඇස්තමේන්තුගත මාසික කුලිය | 3188 | 2470 |

තමා වාසය කරන නිවසේ ඇස්තමේන්තුගත මාසික කුලිය යනාදිය මුදල්මය වශයෙන් නොවන ආදායම් ලෙස ගණන් ගැණෙනු ඇත.

2006/07 මෙන්ම 2009/10 දිද ගෘහ ඒකක සම්පූර්ණ ආදායමෙන් 86% ක්ම, එම ගෘහ ඒකකයට මුදල්මය වශයෙන් ලැබුණු ආදායම් වේ. ශ්‍රී ලංකාවේ ගෘහ ඒකකයන්හි මුදල්මය වශයෙන් ලබන ආදායම් සඳහා ප්‍රධාන සාධකයක් වන්නේ වැටුප් හා වේතන වෙනුවෙන් ලබන ආදායම වේ. මුදල්මය වශයෙන් ලබන ආදායම් අතර, කෘෂිකාර්මික කටයුතු වලින් ලබන ආදායම 2006/07 වසරට වඩා 2009/10 වන විට 2.5% න් ඉහළ ගොස් ඇති බවද නිරීක්ෂණය කළ හැක.

2006/07 වසරේ වතු අංශය තුල මුදල්මය වශයෙන් ගෘහ ඒකකය ලබන ආදායමින් 40% ක්ම වැටුප් හා වේතන වලින් ලැබුණු ආදායම්වේ. 2009/10 වන විට වතු අංශයේ මුදල්මය වශයෙන් ගෘහ ඒකකය ලබන ආදායමින් 51% ක්ම වැටුප් හා වේතන වලින් ලැබුණු ආදායම් ලෙස වාර්තා විය. එනම් 2006 /07 සිට 2009/10 වන විට වතු අංශයේ ගෘහ ඒකක ආදායම තුල වැටුප් හා වේතන වලින් ලැබුණු ආදායම 10% න් වර්ධනයවී තිබුණි.

වගුව 3 : ප්‍රධාන ආදායම් ලබන මාර්ග සහ අංශයන් අනුව සාමාන්‍ය මාසික ගෘහ ඒකක ආදායමේ ප්‍රතිශත ව්‍යාප්තිය - 2006/07 සහ 2009/10

| ආදායම් ලබන මාර්ග | 2009/10 | 2006/07 | 2009/10 | 2006/07 | 2009/10 | 2006/07 | 2009/10 | 2006/07 |
|---|---|---|---|---|---|---|---|---|
| | ශ්‍රී ලංකාව | | නාගරික | | ග්‍රාමීය | | වතු | |
| **සම්පූර්ණ ආදායම** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **100.0** |
| **මුදල්මය ආදායම්** | **85.6** | **85.9** | **80.7** | **84.3** | **86.7** | **86.1** | **86.3** | **91.6** |
| වැටුප් හා වේතන | 34.1 | 35.8 | 36.8 | 35.9 | 32.8 | 35.6 | 51.0 | 39.9 |
| කෘෂිකාර්මික ආර්ථික කටයුතු | 14.4 | 11.9 | 2.0 | 3.3 | 17.6 | 13.4 | 6.3 | 34.1 |
| කාෂිකාර්මික නොවන ආර්ථික කටයුතු | 17.8 | 17.1 | 20.1 | 20.3 | 17.6 | 16.9 | 8.2 | 4.2 |
| වෙනත් මුදල්මය ලැබීම් | 11.7 | 11.9 | 13.1 | 14.4 | 11.3 | 11.3 | 11.4 | 8.5 |
| අනියම් හෝ හදිසි මුදල්මය ලැබීම් | 7.7 | 9.1 | 8.7 | 10.4 | 7.4 | 8.9 | 9.4 | 4.8 |
| **මුදල්මය නොවන ආදායම්** | **14.4** | **14.1** | **19.3** | **15.7** | **13.3** | **13.9** | **13.7** | **8.4** |
| විවිධ ආදායම් | 5.6 | 4.7 | 5.6 | 3.0 | 5.5 | 5.2 | 9.4 | 4.2 |
| නිවාස හිමි පදිංචි නිවසේ ඇස්තමේන්තුගත මාසික කුලිය | 8.7 | 9.4 | 13.7 | 12.7 | 7.8 | 8.7 | 4.2 | 4.2 |

## ආදායම් ලබන්නන්ගේ ආදායම

ගෘහ ඒකකයේ සෑම සාමාජිකයෙකුටම විවිධ ආකාරයෙන් ලැබුණු ආදායම් පිළිබඳව සමීක්ෂණයෙන් තොරතුරු විමසනු ලබයි. වයස අවුරුදු 10 හෝ ඊට වැඩි පුද්ගලයින් සහ මාසික ආදායම රුපියල් 200 ට වැඩි පුද්ගලයින් ආදායම් හා වියදම් සමීක්ෂණයේදි ආදායම් ලබන්නන් ලෙස සලකනු ලබයි.

2009/10 සමීක්ෂණ ප්‍රතිඵල අනුව ශ්‍රී ලංකාවේ ආදායම් ලබන්නන්ගේ සාමාන්‍ය මාසික ආදායම රු. 20,427 ක් විය. එය 2006/07 සමීක්ෂණයේ වාර්තාවු රු. 14,457 ට සාපේක්ෂව 41.3% ක වර්ධනයකි.

ගෘහ ඒකකයක, ආදායම් ලබන්නන් ගණන පුද්ගලයින් 1.8 ක් ලෙස වාර්තාවු අතර, 2006/07 සමීක්ෂණයේදි වාර්තා වුයේද එම පුද්ගලයින් සංඛ්‍යාවමය. ආදායම් ලබන්නන්ගේ වැඩිම මධ්‍යන්‍ය හා මධ්‍යස්ථ ආදායම කොළඹින් වාර්තා වු අතර, අඩුම මධ්‍යන්‍ය ආදායම යාපනය දිස්ත්‍රික්කයෙන් වාර්තා විය. අඩුම මාසික මධ්‍යස්ථ ආදායම් වාර්තා වුයේ නුවරඑළිය දිස්ත්‍රික්කයෙනි.

වගුව 4 : ආදායම් ලබන්නන්ගේ ආදායම ගෘහ ඒකකයේ ආදායම් ලබන්නන් සංඛ්‍යාව සහ ආදායම් ලබන පුද්ගලයින් ප්‍රමාණය - දිස්ත්‍රික් මට්ටමින් -2009/10

| දිස්ත්‍රික්කය | මධ්‍යන්‍ය ආදායම (රු.) | මධ්‍යස්ථ ආදායම (රු.) | ගෘහ ඒකයේ ප්‍රමාණය | ආදායම් ලබන පුද්ගලයින් ගණන |
|---|---|---|---|---|
| **ශ්‍රී ලංකාව** | **20427** | **12500** | **4.0** | **1.8** |
| කොළඹ | 26043 | 16102 | 4.2 | 1.9 |
| ගම්පහ | 25403 | 14703 | 4.0 | 1.9 |
| කළුතර | 17917 | 12000 | 4.1 | 1.9 |
| මහනුවර | 19074 | 12000 | 4.0 | 1.7 |
| මාතලේ | 17241 | 10509 | 3.8 | 1.7 |
| නුවරඑළිය | 16221 | 9650 | 4.1 | 1.9 |
| ගාල්ල | 17357 | 12000 | 4.0 | 1.8 |
| මාතර | 17265 | 12000 | 4.1 | 1.8 |
| හම්බන්තොට | 20417 | 13800 | 4.1 | 1.8 |
| යාපනය | 12539 | 10500 | 4.3 | 1.5 |
| වව්නියාව | 21475 | 15950 | 4.4 | 1.8 |
| මඩකලපුව | 14723 | 11527 | 4.1 | 1.6 |
| අම්පාර | 16515 | 12307 | 4.3 | 1.5 |
| ත්‍රිකුණාමලය | 16102 | 14086 | 4.4 | 1.5 |
| කුරුණෑගල | 22187 | 11892 | 3.7 | 1.6 |
| පුත්තලම | 20318 | 12001 | 3.9 | 1.6 |
| අනුරාධපුර | 23144 | 15000 | 3.8 | 1.6 |
| පොළොන්නරුව | 19133 | 13864 | 3.9 | 1.7 |
| බදුල්ල | 18671 | 10900 | 3.9 | 1.7 |
| මොණරාගල | 14048 | 10783 | 4.0 | 1.6 |
| රත්නපුර | 22283 | 10900 | 4.0 | 1.8 |
| කෑගල්ල | 15694 | 10800 | 3.9 | 1.9 |

## ඒක පුද්ගල ආදායම

කිසියම් ප්‍රදේශයක සියළු ගෘහ ඒකකවලට ලැබුණු සම්පූර්ණ ආදායම එම ප්‍රදේශයේ මුළු ජනගහනයෙන් බෙදිමෙන් ඒක පුද්ගල ආදායම තීරණය කරනු ලබයි. ඒ අනුව 2009/10 සමීක්ෂණයෙන් වාර්තා වු ශ්‍රී ලංකාවේ මාසික ඒක පුද්ගල ආදායම රුපියල් 9,104 කි. 2006/07 සමීක්ෂණයේදි එය රුපියල් 6,963 ක් වශයෙන් වාර්තාවී තිබු බැවින්, එම වසරට සාපේක්ෂව 2009/10 සමීක්ෂණයෙන් වාර්තාවු ඒක පුද්ගල ආදායම 41% ක වර්ධනයක් පෙන්නුම් කර ඇත. වැඩිම මධ්‍යන්‍ය ඒක පුද්ගල ආදායම ගම්පහ දිස්ත්‍රික්කයෙන් වාර්තා වු අතර, අඩුම අගය යාපනය දිස්ත්‍රික්කයෙන් වාර්තා විය. මේ අතර වැඩිම මධ්‍යස්ථ ඒක පුද්ගල ආදායම වාර්තා වුයේ කොළඹ දිස්ත්‍රික්කයෙනි.

## ආදායම් විෂමතා

ආදායම් ව්‍යාප්තිය සහ ජනතාවගේ **ආර්ථික අසමානතාවන් අනුව ආදායම් විෂමතා** ගණනය කරනු ලබයි. ආදායම් විෂමතා ඇතිවීම පැහැදිලි කිරීමට බොහෝ සිද්ධාන්ත තිබේ. විෂමතා මිනුම්, ව්‍යාප්තියේ මධ්‍යන්‍ය සමග වෙනස් නොවන බවද සම්පූර්ණ ජනගහනයම අර්ථවත් කරන බවද කිව යුතුය. වඩාත් පුළුල් වශයෙන් භාවිත කරනු ලබන විෂමතා මිනුම් ලෙස ගිනි සංගුණකය සහ පංචම අපකිරණ අනුපාතිකය ආදායම් විස්තර කිරීමේදී උපකාරී කරගනු ලබයි.

### ගිනි සංගුණකය

ගිනි සංගුණකයේ අගය 0 ත් 1 ත් අතර අගයක් ගනී. 0 මගින් ආදායම් ව්‍යාප්තියේ පරිපූර්ණ සමානතාවයද 1 මගින් උපරිම විෂමතාවද දක්වනු ලබයි. ගිනි අගය ඉහළ විට අසමානතාවයද ඉහළ වේ. කෙසේ නමුත්, දත්ත ගොනුවක ඇති අන්ත අගයන් මගින් ගිනි සංගුණකයේ අගය අපැහැදිලි විය හැකි බැවින් මෙම සංගුණකය මගින් ලබාගත හැක්කේ විෂමතාවයන් පිළිබඳ මූලික අදහසක් පමණි.

2009/10 සමීක්ෂණයෙන් ගණනය කරන ලද ගිනි සංගුණතා අගය 0.49 කි. 2006/07 සමීක්ෂණයේදී වාර්තාවූයේද එම අගයමය. රත්නපුර දිස්ත්‍රික්කයෙන් ගිනි සංගුණතාව සඳහා වැඩිම අගයක් ලැබුණ අතර, එය 0.57 කි. අඩුම අගය ලැබුණේ යාපනය දිස්ත්‍රික්කයෙනි. එය 0.37 ක් විය. ගිනි සංගුණතා අගයේ විශාලම අඩුවීම කොළඹ දිස්ත්‍රික්කයෙනි (0.53 සිට 0.45 දක්වා) එමෙන්ම ගිනි සංගුණතා අගය ඉහළයාමක් (0.44 සිට 0.51 දක්වා) ගම්පහ දිස්ත්‍රික්යෙන් වාර්තා විය. එනම් දිස්ත්‍රික්කය තුල පුද්ගලයින්ගේ ආදායම් අතර විෂමතාවයේ අඩුවීමක් කොළඹ දිස්ත්‍රික්කයෙන් වාර්තා වු අතර. ගම්පහ දිස්ත්‍රික්කය තුල ජනතාවගේ ආදායම් අතර විෂමතාව 2006/07 ට වඩා 2009/10 ඉහල ගොස් තිබුණි.

රූපය 3 : දිස්ත්‍රික් මට්ටමින් ගිනි සංගුණකය - 2009/10




සමස්ත ගෘහ ඒකක ආදායමින් 4.5% ක්ම අවම ආදායම් සහිත ගෘහ ඒකක 20% අඩංගු පංචමකයෙන් වාර්තා විය. 2006/07 සමීක්ෂණයේදී සමස්ත ගෘහ ඒකක ආදායමෙන් 4.4% ක් එම පංචමකයේ විය. එමෙන්ම සමස්ත ගෘහ ඒකක ආදායමෙන් 54.1% ක්ම වැඩිම ආදායම් සහිත ගෘහ ඒකක අඩංගු ඉහළම පංචමකයෙන් වාර්තා විය. 2006/07 සමීක්ෂණයේදී මුළු ආදායමෙන් 55.1% ක් දිවයිනේ පොහොසත්ම ගෘහ ඒකක 20% න් (ඉහළම පංචමකයෙන්) වාර්තා වී තිබිණි.

### පංචමක අපකිරණ අනුපාතිකය

දිවයිනේ පොහොසත්ම ගෘහ ඒකක 20% ලබන මාසික ආදායම සහ දුප්පත්ම ගෘහ ඒකක 20% ලබන මාසික ආදායම අතර අනුපාතිකයක් ලෙස, **ආදායම් ව්‍යාප්තියක පංචමක අපකිරණ අනුපාතිකය** විස්තර කළහැක. ඉහළ අනුපාතිකයක් මගින් වැඩි විෂමතාවක් පැහැදිලි කරයි. 2006/07 සහ 2009/10 සමීක්ෂණ ඇසුරින් වාර්තාවූ ගෘහ ඒකක ආදායම් මට්ටම් පංචමක වශයෙන් විස්තර කිරීමක් වගුව 5 න් දැක්වේ. සෑම පංචමකයක් තුලම මුළු ගෘහ ඒකක වලින් 20% ක් ඇතුලත්වේ.

වගුව 5 : 2006/07 හා 2009/10 සමීක්ෂණවලදී ගෘහ ඒකක ආදායම් මට්ටම් - පංචමක වශයෙන්

| | අඩුම | පහල මධ්‍යම | මධ්‍යම | ඉහල මධ්‍යම | වැඩිම | සමස්ත ආදායම |
|---|---|---|---|---|---|---|
| | ගෘහ ඒකක ආදායමේ පංචමකය | | | | | |
| **2009/10** | | | | | | |
| මාසික ගෘහ ඒකක ආදායම (රු.) | 8211 | 16062 | 23880 | 35552 | 98575 | 36451 |
| ප්‍රතිශත ආදායම | 4.5 | 8.8 | 13.1 | 19.5 | 54.1 | 100.0 |
| ආදායමේ සමුච්චිත ප්‍රතිශතය | 4.5 | 13.3 | 26.4 | 45.9 | 100.0 | |
| ජනගහනයේ සමුච්චිත ප්‍රතිශතය | 20.0 | 40.0 | 60.0 | 80.0 | 100.0 | |
| | **පංචම අපකිරණ අනුපාතිකය = 98575/8211= 12.0** | | | | | |
| **2006/07** | | | | | | |
| මාසික ගෘහ ඒකක ආදායම (රු.) | 6002 | 11464 | 17125 | 26128 | 74552 | 26286 |
| ප්‍රතිශත ආදායම | 4.4 | 8.5 | 12.7 | 19.3 | 55.1 | 100.0 |
| ආදායමේ සමුච්චිත ප්‍රතිශතය | 4.4 | 12.9 | 25.5 | 44.8 | 100.0 | |
| ජනගහනයේ සමුච්චිත ප්‍රතිශතය | 20.0 | 40.0 | 60.0 | 80.0 | 100.0 | |
| | **පංචම අපකිරණ අනුපාතිකය = 74552/6002= 12.4** | | | | | |

ගතවූ සමීක්ෂණ කාල වකවානු අතුරින් පංචමක අතර සැලකිය යුතු තරම් වෙනසක් වාර්තාවී නොතිබුණ අතර, පංචමක අපකිරණ අනුපාතිකය අඩුවී තිබුණේ 0.4% කිනි. එනම්, තවමත් ශ්‍රී ලංකාවේ ගෘහ ඒකක වලින් 80% ක්ම සමස්ත ගෘහ ඒකක ආදායමෙන් 45% කට ආසන්නව පමණක් ලබන බව පැහැදිලි කරගත හැක. එමෙන්ම සමස්ත ගෘහ ඒකක ආදායමෙන් පොහොසත්ම 20% (ඉහළම පංචමකය) ලැබූ ආදායම් 2006/07 සිට 2009 /10 වන විට ක්‍රමික අඩුවීමකින්ද වාර්තාවේ.

මේ ආකාරයෙන් ගිනි සංගුණකය මගින් විස්තර කළ නොහැකි ආදායම් විෂමතාවන් පිළිබඳ පැහැදිලි කිරීම මෙමගින් ඉතා හොඳින් නිරීක්ෂණය කරමින් පැහැදිලි කරගත හැකිවෙයි.

*පිටුව 6*

## ගෘහ ඒකක වියදම

සමීක්ෂණය සඳහා ගෘහ ඒකක වියදම ලබා ගැනීම සමීක්ෂණ උපලේඛනයේ ප්‍රධාන කාණ්ඩ 3 ක් යටතේ සිදු කරනු ලබයි.

1. ආහාර සඳහා වන වියදම්
2. ආහාර නොවන ද්‍රව්‍ය සඳහා වන වියදම්
3. ගෘහ ඒකකයේ නේවාසිකයින් සහ ගෘහ සේවකයින් විසින් දරණ ලද වියදම්

නිරවද්‍ය සහ ගුණාත්මක දත්තයන් ලබා ගැනීම පහසු කරවීම් වස් විවිධ පරිභෝජන භාණ්ඩ මිලදී ගැනීම් සඳහා විවිධ වූ යොමු කාලයන් භාවිත කරනු ලබයි. එනම් ආහාර සඳහා සතියක වියදමද, නිවාස, ඉන්ධන හා ජල විදුලි වැනි වියදම් සඳහා මාසික වියදමද, ඇඳුම් පැළඳුම් සඳහා මාස 06 ක් තුල වියදමද, කල් පවතින භාණ්ඩ මිලදී ගැනීම සඳහා මාස 12 ක් තුල වියදමද යනාදි වශයෙනි.

වගුව 6 න් විස්තර වන පරිදි ශ්‍රී ලංකාවේ සාමාන්‍ය මාසික ගෘහ ඒකක වියදම රු.31,331 ක් විය. ආහාර සඳහා වූ වියදම රු. 13,267 ක්ද, ආහාර නොවන ද්‍රව්‍ය සඳහා වියදම රු. 18,064 ක්ද වශයෙන් විය. එනම් සාමාන්‍ය මාසික ගෘහ ඒකක වියදමින් 42.3% ක් ආහාර සඳහාද, 57.7% ක් ආහාර නොවන ද්‍රව්‍ය සඳහාද වැයවී තිබුණි. 2006/07 සමීක්ෂණයේදී වාර්තා වූ සාමාන්‍ය මාසික ගෘහ ඒකක වියදම රු. 22,952 කි. එයින් රු.8,641 ක්, එනම් සම්පූර්ණ වියදමින් 37.6% ක් ආහාර ද්‍රව්‍ය සඳහාද, රු. 14,311 ක් (62.4%) ක් ආහාර නොවන ද්‍රව්‍ය සඳහාද වියදම්වී තිබුණි.

**රූපය 4 : 2002 සිට 2009/10 දක්වා ආහාර සහ ආහාර නොවන ද්‍රව්‍ය සඳහා මූර්ත හා නාමික සාමාන්‍ය මාසික ගෘහ ඒකක වියදම (2002 මිල පාදක කර ගනිමින්)**




2002 සමීක්ෂණ වසරේ සිට 2009/10 දක්වාම ආහාර සඳහා නාමික වියදම මෙන්ම, ආහාර නොවන ද්‍රව්‍ය සඳහා නාමික වියදමද, පවතින මිල ගණන් අනුව ක්‍රමිකව ඉහළයාමක් දක්නට ලැබේ. කෙසේ වෙතත්, ආහාර නොවන ද්‍රව්‍ය සඳහා මූර්ත මධ්‍යන්‍ය වියදම 2006/07 සිට 2009/10 වන විට 10.7% කින් පහත බැස තිබේ. නමුත් ආහාර සඳහා මූර්ත මධ්‍යන්‍ය වියදම 8.6% කින් ඉහළ ගොස් තිබිණි. ගෘහ ඒකක මූර්ත වියදම 3.5% න් පහත බැස තිබූ අයුරුද රූපය 5 න් නිරූපනය වෙයි.

මධ්‍යස්ථ මාසික ගෘහ ඒකක වියදම රු. 24,509 කි. එය 2006/07 සමීක්ෂණයේදී වාර්තා වූ මධ්‍යස්ථ මාසික ගෘහ ඒකක වියදම වූ රු. 16,640 ට වඩා 47.3% කින් ඉහලයාමකි.

ගෘහ ඒකක මූර්ත මධ්‍යස්ථ වියදමද 4.2% න් වැඩිවී තිබේ. එනම්, ජනතාවගේ ජීවන තත්වයන් යහපත් මට්ටමකට එළඹෙමින් තිබේ. දුප්පත්කම තුරන් කිරීමට ජීවන තත්වයන් යහපත්වීම අවශ්‍යයෙන්ම විය යුත්තකි.

**වගුව 6 : දිස්ත්‍රික් මට්ටමින් සාමාන්‍ය මාසික ගෘහ ඒකක වියදම 2006/07 සහ 2009/10**

| දිස්ත්‍රික්කය | සාමාන්‍ය මාසික ගෘහ ඒකක වියදම (රු“) | |
|---|---|---|
| | 2009/10 | 2006/07 |
| | | |
| ශ්‍රී ලංකාව | **31331** | **22952** |
| | | |
| කොළඹ | 47291 | 37011 |
| ගම්පහ | 41062 | 29145 |
| කළුතර | 35549 | 24911 |
| මහනුවර | 29767 | 21762 |
| මාතලේ | 26528 | 19066 |
| නුවරඑළිය | 26841 | 14220 |
| ගාල්ල | 27370 | 23079 |
| මාතර | 29408 | 21348 |
| හම්බන්තොට | 30744 | 20568 |
| යාපනය | 22725 | - |
| වව්නියාව | 35391 | - |
| මඩකලපුව | 23508 | 21592 |
| අම්පාර | 26699 | 22311 |
| ත්‍රිකුණාමලය | 25623 | - |
| කුරුණෑගල | 25201 | 18452 |
| පුත්තලම | 27376 | 21332 |
| අනුරාධපුර | 29065 | 20290 |
| පොළොන්නරුව | 30315 | 21202 |
| බදුල්ල | 24873 | 17335 |
| මොණරාගල | 21131 | 13155 |
| රත්නපුරය | 25477 | 16423 |
| කෑගල්ල | 25723 | 15773 |
| | | |

**රූපය 5 : නාමික හා මූර්ත සාමාන්‍ය මාසික වියදම**
***(2002 පැවත මිල පාදක කර ගනිමින්)***



*පිටුව 7*

## ගෘහ ඒකක ආහාර වියදම

ආහාර සහ ආහාර නොවන ද්‍රව්‍ය සඳහා වන සම්පූර්ණ වියදමෙන්, ආහාරපාන සඳහා පමණක්වූ වියදම ප්‍රතිශතයක් ලෙස ගෙන **ආහාර වියදම් අනුපාතිකය** ගණනය කරනු ලබයි. දිවයින වෙනුවෙන් හෝ තෝරාගත් ප්‍රදේශයක් තුල ජනතාවගේ ජිවන තත්වයන් පිළිබඳව දළ මිණුමක් මෙමගින් ලබාගත හැකිවනු ඇත

$$\text{ආහාර වියදම් අනුපාතිකය (\%)} \quad \frac{\text{ආහාර පාන සඳහා වූ වියදම}}{\text{මුළු වියදම}} \times 100$$

2002 දී 44.5% ක් ලෙස වාර්තාවූ ආහාර වියදම් අනුපාතිකය 2006/07 වන විට 37.6% ක් දක්වා අඩුවී තිබුණි. නමුත් 2009/10 සමීක්ෂණයේදි 4.7% කින් ක්ෂණිකව වර්ධනයවී 42.3% ක අගයක් ගෙන තිබෙනු නිරීක්ෂණය විය.

ප්‍රධාන ආහාර ද්‍රව්‍ය අතරින් ඒක පුද්ගල මාසික සහල් පරිභෝජනය ග්‍රෑම් 9062 ක් විය. 2006/07 සමීක්ෂණයේදි එය ග්‍රෑම් 8995 ක් වශයෙන් වාර්තා විය. ඒක පුද්ගල මාසික පාන් පරිභෝජනය ග්‍රෑම් 267 කින් අඩුවී තිබුණි. ඒක පුද්ගල මාසික සහල් පරිභෝජනයෙහි වැඩිවීම මෙන්ම, තිරිඟු පිටි පරිභෝජනයෙහි ග්‍රෑම් 103 ක වැඩිවීමද නිරීක්ෂණය කළ හැකිවිය.

සහල් වර්ග අතරින් නාඩු සහ සම්බා සහල් පරිභෝජනයට වඩා කැකුළු සහල් පරිභෝජනය ඉහළ මට්ටමක පැවතුණද, 2006/07 දී කි. ග්‍රෑ. 4.3 ක්ව තිබූ ඒක පුද්ගල මාසික කැකුළු සහල් පරිභෝජනය 2009/10 දී කි. ග්‍රෑ. 4.1 ක් දක්වා අඩුවී තිබුණි. කෙසේ වෙතත්, 2006/07 සිට 2009/10 දක්වා කැකුළු, සම්බා සහ පරිප්පු ඒක පුද්ගල මාසික පරිභෝජනය ක්‍රමයෙන් අඩුවී තිබුණද, ඒක පුද්ගල මාසික නාඩු සහල් පරිභෝජනය කි.ග්‍රෑ. 2.9 සිට කි.ග්‍රෑ. 3.2 ක් දක්වා වූ වර්ධනයක් දැකිය හැකිවිය.

පොල් සහ ලොකු ලූණු පරිභෝජන රටාවේ සැලකිය යුතු වෙනසක් දක්නට නොලැබුණි. නමුත් 2006/07 ට වඩා 2009/10 වන විට ඒක පුද්ගල මාසික සීනි පරිභෝජනය ග්‍රෑම් 63 කින් අඩුවී තිබෙනු නිරීක්ෂණය විය

**වගුව 7 : තෝරාගත් ආහාර ද්‍රව්‍ය කීපයක් සඳහා සාමාන්‍ය මාසික ඒක පුද්ගල පරිභෝජනය**

| අයිතමය | | 2009/10 | | 2006/07 | |
|---|---|---|---|---|---|
| | | | වටිනාකම | | වටිනාකම |
| | ඒකකය | ප්‍රමාණය | (රු.) | ප්‍රමාණය | (රු.) |
| සහල් (සම්බා) | ග්‍රෑම් | 1643 | 119 | 1781 | 67 |
| සහල් (නාඩු) | ග්‍රෑම් | 3278 | 210 | 2903 | 91 |
| සහල් (කැකුළු) | ග්‍රෑම් | 4127 | 244 | 4307 | 133 |
| තිරිඟු පිටි | ග්‍රෑම් | 687 | 47 | 584 | 24 |
| පාන් (සාමාන්‍ය) | ග්‍රෑම් | 1266 | 106 | 1533 | 74 |
| පරිප්පු | ග්‍රෑම් | 501 | 99 | 566 | 49 |
| ලොකු ලූණු | ග්‍රෑම් | 582 | 46 | 570 | 31 |
| සීනි | ග්‍රෑම් | 1212 | 113 | 1275 | 77 |
| පොල් | ගෙඩි | 7 | 184 | 7 | 116 |

ඒක පුද්ගල මාසික පොල් පරිභෝජනය පොල් ගෙඩි 7 ක් විය. එය සමීක්ෂණය පැවති වසර කීපය මුළුල්ලේම නොවෙනස්ව පැවතුණි. 2009/10 සමීක්ෂණය පැවති වසර තුල පොල් සහ පොල්තෙල්වල ගෘහ ඒකක පරිභෝජනය වෙළඳපල පැවති මිල ගණන් සහ ඒ අනුව සිදුවූ කාලීන වෙනස්වීම් රටාව රූපය 6 මගින් ප්‍රදර්ශනය කෙරේ.

2009 නොවැම්බර් මාසය තුල මාසික ගෘහ ඒකක පොල් පරිභෝජනය ගෙඩි 30 සිට 27.9 දක්වා අඩුවීමක් දක්නට ලැබේ. පොල් ගෙඩියක සාමාන්‍ය මිල රුපියල් 22 සිට 25 දක්වා එම මාසය තුල ඉහළ ගොස් තිබුණි.

**රූපය 6 : සාමාන්‍ය මාසික පොල් පරිභෝජනය සහ පොල් සහ පොල් තෙල් හි මිල ගණන්**




කෙසේ වෙතත්, දෙසැම්බර් සහ ජනවාරි මාස තුල පොල් ගෙඩියක මිල රුපියල් 27 දක්වා තවත් වැඩිවුවද, එම උත්සව සමයේ මාසික ගෘහ ඒකක පොල් පරිභෝජනයද පොල් ගෙඩි 31 දක්වා ඉහළ ගොස් තිබුණි. ක්‍රමයෙන් අප්‍රේල් සිට ජූනි වන විට මාසික ගෘහ ඒකක පොල් පරිභෝජනය ගෙඩි 29 හා 28 දක්වා පහත බැස තිබුණි.

අප්‍රේල් උත්සව සමය තෙක් පැවති පොල් මිලෙහි ඉහළ යාම පසුව තරමක් පාලනය වුවද, එය කලින් පැවති මිල වන රුපියල් 22 සීමාවට පැමිණියේ නැත. 2010 ජූනි වන විට පොල් ගෙඩියක මිල රුපියල් 26 ට පැමිණියේය.

පොල්තෙල් ලීටරයක මිල ඉහළ යාමද දෙසැම්බර් මාසයේ ඇරඹිණි. දෙසැම්බර් මාසයේ රුපියල් 194 ක්ව පැවති පොල්තෙල් ලීටරයක මිල අප්‍රේල් සිංහල අළුත් අවුරුදු සමය වන විට රුපියල් 223 දක්වා ඉහළ ගොස් තිබිණි.

*පිටුව 8*

## ආහාර නොවන ද්‍රව්‍ය සඳහා වන වියදම

ආහාර නොවන ද්‍රව්‍ය සඳහා වන වියදම තුල විශාල අගයක් ගෙන තිබුණේ නිවාස සඳහා වූ වියදමය. මෙය සෑම ගෘහ ඒකක ආදායම් වියදම් සමීක්ෂණයකින්ම අනාවරණයවූ කරුණකි. තමාගේම නිවසක් හෝ කිසිඳු කුලියක් හෝ ගෙවීමක් නොකර, වාසය කරන නිවසක් වෙනුවෙන් ඇස්තමේන්තු කරන ලද නිවසේ කුලී වටිනාකමද, ගෘහ ඒකකයේ නිවාස සඳහා වන වියදමට ඇතුලත්කර ඇත.

වගුව 8 න් පැහැදිලි වන පරිදි, ආහාර නොවන ද්‍රව්‍ය සඳහා යන වියදමෙන් 26.6% ක්ම වෙනත් අහඹු වියදම් විය. යොමු කාලය තුල (පසුගිය මාස 12 තුල) විටින් විට හෝ එක් වතාවක් හෝ සිදුවූ විවාහ උත්සව, අවමංගල, ආගමික ආදි ඕනෑම සමාජ හෝ සංස්කෘතිකමය කටයුත්තක් සඳහා වැයවූ වියදම් අහඹු වියදම් ලෙස ගණන් ගැණින. එමෙන්ම ණය ගෙවීම්, නිවසේ අළුත්වැඩියාවක් හෝ නව ඉදිකිරීමක්, මුදල් ප්‍රදානයක් හෝ ඉතිරි කිරීමක් මෙන්ම, නිවසේ වෙනත් සේවාවන් සඳහා වූ වියදම් යටතට ගැණෙන, ලොන්ඩරි සේවා, ගෘහ සේවකයන් සඳහා ගෙවීම්, දිවා සුරැකුම් මධ්‍යස්ථාන වෙත ගෙවීම් වැනි සියළු වියදම් මේ යටතේ අහඹු වියදම් ලෙස ගණන් ගැණින.

**රූපය 8 : තෝරාගත් ආහාර නොවන ද්‍රව්‍ය කීපයක් සඳහා වියදම් රටාවෙහි වෙනස්වීම (2002 - 2009/10 දක්වා)**




**වගුව 8 : ප්‍රධාන ආහාර නොවන ද්‍රව්‍ය කාණ්ඩ කීපයක් සඳහා සාමාන්‍ය මාසික ගෘහ ඒකක වියදම 2006/07 - 2009/10**

| අයිතමය | 2009/10 | | 2006/07 | |
|---|---|---|---|---|
| | වටිනාකම (රු.) | (%) | වටිනාකම (රු.) | (%) |
| ආහාර නොවන ද්‍රව්‍ය සඳහා වූ සම්පූර්ණ වියදම | 18064 | 100.0 | 14311 | 100.0 |
| නිවාස | 3446 | 19.1 | 2639 | 18.4 |
| ඉන්ධන හා විදුලිය | 1278 | 7.1 | 1042 | 7.3 |
| ඇඳුම්, රෙදිපිලි හා පාවහන් | 903 | 5.0 | 694 | 4.8 |
| සෞඛ්‍ය හා පෞද්ගලික අවශ්‍යතා | 1429 | 7.9 | 980 | 6.8 |
| ප්‍රවාහනය හා පණිවුඩ හුවමාරුව | 3072 | 17.0 | 2401 | 16.8 |
| අධ්‍යාපනය | 1018 | 5.6 | 632 | 4.4 |
| විනෝද හා සංස්කෘතික කටයුතු | 402 | 2.2 | 260 | 1.8 |
| කල් නොපවතින භාණ්ඩ | 264 | 1.5 | 301 | 2.1 |
| දිගුකල් පවතින භාණ්ඩ | 780 | 4.3 | 786 | 5.5 |
| වෙනත් අහඹු වියදම් | 4807 | 26.6 | 4084 | 28.5 |
| මත්වතුර, මත්ද්‍රව්‍ය හා දුම්කොළ ආශ්‍රිත | 665 | 3.7 | 492 | 3.4 |

ආහාර නොවන ද්‍රව්‍යයන් සඳහා වූ මූර්ත වියදමෙහි අඩුවීම නොසලකනවිට, ප්‍රධාන ආහාර නොවන ද්‍රව්‍ය කාණ්ඩ අතර ගෘහ ඒකක වියදමෙහි සැලකිය යුතු තරම් වෙනස්වීමක් ගතවූ වසර 3 තුල සිදුවී නැති බව වගුව 8 අනුව නිරීක්ෂණය වෙයි. එය එසේ පවතිද්දී ගෘහ ඒකකවල ආහාර පුරුදුවල කිසියම් වෙනසක් සිදුවී ඇති අතර, එහි ප්‍රතිඵලය ලෙස ආහාර පරිභෝජනය සහ ආහාර සඳහා වූ වියදමද මද වශයෙන් ඉහළ ගොස් තිබෙණු නිරීක්ෂණය කලහැකි විය.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
15/12
මේට්ලන්ඩ් චන්ද්‍රවංකය, කොළඹ 07

නියැදි සමීක්ෂණ අංශය,
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
8 වැනි මහල,
"යුනිටි ප්ලාසා" ගොඩනැගිල්ල, කොළඹ 04.

දුරකථන : 011-2508689
ෆැක්ස් (Fax) : 011-2508690
ඊ මේල් : sample.survey@statistics.gov.lk

වෙබ් අඩවිය
www.statistics.gov.lk

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ මෙහෙවර හා දැක්ම**

**දැක්ම**

දේශයේ සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා කාලීන තොරතුරු ලබා දෙන්නවුන් අතරින් කලාපයේ පෙර ගමන්කරු බවට පත්වීම.

**මෙහෙවර**

ගෝලීයකරණ පසුබිමක් තුල සමෘධිමත් ජාතියක් බවට පත්වීම සඳහා නව තාක්ෂණය, සේවක කැපවීම සහ උපායශීලි නායකත්වය තුළින් වඩාත් ඵලදායී අයුරින් කාලීන වූත්, නිවැරදි වූත් දත්ත ලබා දීම මගින් දේශයෙහි සමාජ ආර්ථික සංවර්ධනයට දායකවීම.